# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 2007 අංක 12 දරන හර බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2007 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 4 .25 යි. තැපැල් ගාස්තුව **:** රු. 5 .00 යි.

## 2007 අංක 12 දරන හර බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 5/2007

### 2002 අංක 16 දරන හර බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2007 අංක 12 දරන හර බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 16 දරන හර බදු පනතේ 5 වන වගන්තියේ, 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, 14 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල, 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හැර, ඒ පනතේ කවර හෝ ස්ථානයක "වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක්" යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම ඒ වෙනුවට "වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක් හෝ මූල්‍ය සමාගමක්" යන වචන ආදේශ කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2002 අංක 16 දරන හර බදු පනතට කරනු ලබන සාමාන්‍ය සංශෝධන.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 3 වන සහ 4 වන වගන්තිවල, 9 වන වගන්තියේ (1අ) උපවගන්තියේ, 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඉ) ඡේදවල සහ 13 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "වාණිජ බැංකුවක්" යන වචන වෙනුවට "වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2, 3 සහ 4 වන වගන්ති සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධන කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ජංගම ගිණුම" යන යෙදුමේ අර්ථ නිරූපනයේ "වාසික විදේශ මුදල් ගිණුමක්, විදේශීය ව්‍යවහාරික මුදල් බැංකු ඒකකයේ ගිණුමක් සහ කොටස් ආයෝජන සහිත බාහිර රුපියල් ගිණුමක්" යන වචන වෙනුවට "වාසික විදේශ මුදල් ගිණුමක්, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයේ ගිණුමක්, ආයෝජන සහිත බාහිර රුපියල් ගිණුමක් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "ඉතිරි කිරීමේ ගිණුම" යන යෙදුමේ අර්ථ නිරූපනයේ "බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක පවත්වාගෙන යන්නාවූ ද," යන වචන වෙනුවට "බලපත්‍රලත් වාණිජ බැංකුවක, බලපත්‍රලත් විශේෂිත බැංකුවක හෝ මුල්‍ය සමාගමක පවත්වාගෙන යන්නා වූ ද," යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5**. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.